# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/53 - 2021 අගෝස්තු මස 06 වැනි සිකුරාදා - 2021.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 1948 සැප්තැම්බර් මස 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු මස 17 දාතම හා අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු මස 25 දාතම අංක 14778 *ගැසට් පත්‍රයේ* ද, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව, 2009.10.02 වැනි දින අංක 1622 දරන *ගැසට් පත්‍රයේ* ද පළවූ බදුල්ල කතරගම දේවාලයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථාව අනුව ද බදුල්ල ප්‍රාදේශීය ලේකම් ඩී. එම්. එල්. එච්. දිසානායක වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2021 බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

(1) 2021 සැප්තැම්බර් මස 08 වැනි දින අළුයම කප් සිටුවීමෙන් බදුල්ල කතරගම දේවාලයේ වාර්ෂික පෙරහැර ආරම්භ වී, 2021 සැප්තැම්බර් මස 08 වැනි දින සිට 11 දින දක්වා (දින 04) අභ්‍යන්තර පෙරහැර, 2021 සැප්තැම්බර් මස 12 වැනි දින සිට සැප්තැම්බර් මස 16 වැනි දින දක්වා (දින 05) කුඹල් පෙරහැර, 2021 සැප්තැම්බර් මස 17 වැනි දින සිට 21 වැනි දින දක්වා (දින 05) රන්දෝලි පෙරහැර, 2021 සැප්තැම්බර් මස 22 වැනි දින අළුයම දිය කැපීමේ මංගල්‍යය, 2021 සැප්තැම්බර් මස 22 වැනි දින දහවල් පෙරහැර ගෙවදීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

(2) *පෙරහැරේ ගමන් මාර්ගය.* - 2021 සැප්තැම්බර් මස 21 වැනි දින පමණක් බදුල්ල කතරගම දේවාලයේ සිට බදුල්ල පහළ වීදිය, පස්සර පාර (මුතියංගණ වට රවුම), ලොන්ඩන් පාර, අනගාරික ධර්මපාල මාවත, කොකෝවත්ත පාර, උදයරාජ මාවත, රජ වීදිය, කඩවීදිය, පහළ වීදිය, බදුල්ල කතරගම දේවාලයට ගෙවදීම.

(3) බදුල්ල කතරගම දේවාල භූමිය හා දේවාලයට අයත් සිංහාසනය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමිභාගවල ආහාර පිසීම හා වෙළෙඳාම් කිරීම තහනම් කරමි.

(4) පෙරහැර කාලය තුළ දී ප්‍රධාන මාර්ගවල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මගෙන් හෝ දේවාල භාර නිලමේ තුමාගෙන් බලපත්‍රයක් නොමැතිව දේවාල භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

(5) පෙරහැර ගමන් ගන්නා මාර්ගයන්හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදි කරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකුල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළෙඳුන් විසින් දේවාල පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා දේවාල භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

(6) මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

(7) කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව මගින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

(8) රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

(9) ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තකු විසින් අංක 03හි දැක්වෙන කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

**ඩී. එම්. එල්. එච්. දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2021 අගෝස්තු මස 04 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 294

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.